මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/15-18/TO/ EB - 2018(II) (2023) | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022-10-27 |

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ,

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (II) (2023)**

උක්ත විභාගය සඳහා අයැදුම්පත් කැඳවා 2022.10.21 දිනැතිව අංක 2,303 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ලේකම්ගේ නිවේදනය කෙරෙහි ඔබ ආයතනයේ සේවයේ නියුතු , 2022.11.21 වන දිනට මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට හා II ශ්‍රේණියට ( II වැනි පන්තියේ "ආ" ඛණ්ඩයට සහ "අ" ඛණ්ඩයට ) ඇතුළත්ව සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවන ලෙස කාරුණිකව දන්වමි.

02. එම විභාග නිවේදනය පරිදි සුදුසුකම් සම්පූර්ණ කර ඇති මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ නිලධාරීන් ගැසට් නිවේදනයේ සඳහන් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව තමන් විසින් සකස් කර ගත් අයදුම්පත්‍ර 2022 නොවැම්බර් 21 වන දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත යැවිය හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් මෙම කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස දන්වමි.

03. විභාග ගාස්තු මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශිර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ ඇලවිය යුතුය.

04. අදාළ ගැසට් නිවේදනය හා ඉහත උපදෙස් හොඳින් කියවා තේරුම් ගෙන අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් වලින් බැහැරව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙසත් අදාළ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

ටී.ජී.ඩබ්ලිව්. දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත:
මධ්‍යම පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.
උක්ත විභාගයට අදාළ විභාග ගාස්තු (පසු වාරවලදී සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටින නිලධරයන්ගෙන් රු:500 ක විභාග ගාස්තුවක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින නිලධරයන් සඳහා රු.250ක විභාග ගාස්තුවක් ද) අයකර මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශිර්ෂ 20-03-02-13 ට බැර කරන ලෙස කාරුණිකව ඉල්ලමි. මේ සම්බන්ධයෙන් දක්වන්නාවූ සහයෝගය ඉතා අගය කොට සලකමි.